නාලන්දා විද්‍යාලය - කොළඹ 10

ඒකක පරීක්ෂණය

11 ශ්‍රේණිය	නර්තනය	2.3.1 ඒකකය

කාලය : පැය 02

තුන් තිතේ ප්‍රභේද දක්වමු.

- **හිස්තැනට ගැලපෙන පිළිතුර තෝරන්න.**

01. තුන් තිතේ ප්‍රභේද ..... කි.

(1). 4 කි (2). 6 කි (3). 8 කි (4). 10 කි

02. දෙසුළු මැදුම් තුන් තිතේ තාල රූපය ..... වේ.

(1). 2 + 2 + 3 (2). 3 + 3 + 2 (3). 2 + 3 + 2 (4). 3 + 2 + 3

03. තුන් තිතේ තිත් රූපය සැදීමට,.....

(1). තිත් 4 ක් ඇත. (2). තිත් 3 ක් ඇත. (3). තිත් 2 ක් ඇත. (4). තිත් 1 ක්ඇත.

04. දෙසුළු මැදුම් තුන් තිතට මාත්‍රා .....කි.

(1). 7 (2). 8 (3). 9 (4). 10

05. '' ∧ ∧ / '' යන සංකේතවලින් ..... ලෙස දැක්විය හැකිය.

(1). තෙයි තෙයි තිත් (2). තෙයි තිත් තෙයි (3). තිත් තිත් තෙයි (4). තිත් තෙයි තිත්

(ලකුණු 3 × 5 = 15)

- **ගැලපෙන පද යොදා හිස්තැන් පුරවන්න.**

01. තාලතැබීමට යොදා ගන්නා තාල වාද්‍ය භාණ්ඩය වන්නේ ..... යි.

02. ''කුදාංත ගත දොං'' වට්ටම නටන්නේ ..... තිතටය.

03. ''කුඳ ගත ගත දොං'' යන බෙර පදය තාල තැබිය හැක්කේ ..... තිතටය.

04. දෙසුළු මැදුම් තුන් තිතට අයත් බෙර පදයකි, ...

05. ''කුඳ ගත ගත දොං'' යන බෙර පදයට මාත්‍රා ..... ක් ඇත.

(ලකුණු 3 × 5 = 15)

- **ප්‍රස්තාර කර දක්වන්න.**

01. දෙසුළු මහ තුන් තිතට අයත් බෙර පදයක් ප්‍රස්තාර කර දක්වන්න.

02. 2 + 2 + 3 තාල රූපයට සුදුසු බෙර පදයක් ප්‍රස්තාර කරන්න.

(ලකුණු 10 × 2 = 20)

සැකසුම : අමිලා ජීවනී